SRI LANKA

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2026 ජනවාරි

## යෝජිත උත්තර

# (104) ව්‍යාපාරික පරිසරය (BEN)


**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන: **011-2-559 669**



මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2026 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

## යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 20 කි
(මුළු ලකුණු 40)

**A කොටස**

### *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**1.1** (4)

**1.2** (1)

**1.3** (3)

**1.4** (3)

**1.5** (2)

**1.6** (4)

**1.7** (3)

**1.8** (3)

**1.9** (2)

***1.10*** (4)

**1.11** සත්‍යයි

**1.12** අසත්‍යයි

**1.13** සත්‍යයි

**1.14** සත්‍යයි

**1.15** අසත්‍යයි

**1.16** විධිමත් සංවිධානයක් යනු නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා නිශ්චිත භූමිකාවන්, නීති, අධිකාරිය සහ වගකීම් සහිත හිතාමතා සැලසුම් කරන ලද ව්‍යුහයකි.

**1.17** හොඳ මුදල්වල ලක්ෂණ පහත දැක්වේ:

- පොදු පිළිගැනීම
- කල්පැවැත්ම
- පහසුවෙන් රැගෙන යා හැකි බව
- කුඩා කොටස්වලට බෙදීමේ හැකියාව
- සමජාතීය බව
- හිඟකම (සැපයුම සීමිතයි)
- වටිනාකමේ ස්ථායිතාව
- ව්‍යාජ ලෙස සකස් කිරීමට අපහසු වීම (පහසුවෙන් මුද්‍රණය කිරීමට නොහැකි වීම)
- නිතර අවලංගු කිරීමට යටත් නොවේ

**1.18** පහත සඳහන් පරිදි, දේශීය වෙළඳාම විදේශීය (ජාත්‍යන්තර) වෙළඳාමෙන් විවිධ අංශ ගණනාවකින් වෙන්කර හඳුනාගත හැකිය.

| දේශීය වෙළඳාම | විදේශීය (ජාත්‍යන්තර) වෙළඳාම |
|---|---|
| එක් රටක් තුළ සිදු වේ | විවිධ රටවල් අතර සිදු වේ |
| ගෙවීම් ක්‍රම ලෙස මුදල් හෝ මුදල්වලට සමාන දෑ භාවිත කරයි | ගෙවීම් ක්‍රම ණයවර ලිපිය වැනි සාපේක්ෂව සංකීර්ණ වේ |
| දේශීය මුදල් භාවිත කරයි | විදේශ මුදල් භාවිත කරයි |
| ජාතික නීති මඟින් පාලනය වේ | ජාත්‍යන්තර වෙළඳ නීති මඟින් පාලනය වේ |
| සරල ලියකියවිලි භාවිත කරයි | සංකීර්ණ ලියකියවිලි භාවිත කරයි |
| සාපේක්ෂව පහසු / සරල රෙගුලාසි | සංකීර්ණ රෙගුලාසි සහ භාවිතයන් |
| අදාල වන්නේ දේශීය වෙළඳ බදු පමණි | දේශීය වෙළඳ බදු සහ ජාත්‍යන්තර වෙළඳ බදු (රේගු බදු, CESS, (PAL) ආදිය) |

SRI LANKA

**1.19** සංවිධානයක කොටස්කරුවන්ට / ඇල්මැති පාර්ශවවලට ඇතුළත් විය හැක්කේ,

- හිමිකරුවන් (කොටස් හිමියන්)
- සේවකයින්
- ගනුදෙනුකරුවන්
- සැපයුම්කරුවන්
- කළමනාකරණය
- රජය
- ණයහිමියන්
- තරඟකරුවන්
- මහජනතාව

**1.20** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අසාර්ථකත්වයට බලපාන අභ්‍යන්තර සාධක අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- දුර්වල කළමනාකරණය සහ දුර්වල නායකත්වය
- මූල්‍ය කළමනාකරණයේ දී නිසි පාලනය සහ විනය නොමැතිකම
- ප්‍රමාණවත් සැලසුම්කරණය සහ උපායමාර්ගයක් නොමැතිකම
- දුර්වල වාර්තා තබා ගැනීම
- දක්ෂ සේවකයින් නොමැතිකම
- අකාර්යක්ෂම මෙහෙයුම්

- දුර්වල අලෙවිකරණ තීරණ
- දුර්වල අභ්‍යන්තර පාලනයන්
- පර්යේෂණ හා නවෝත්පාදන නොමැතිකම
- දුර්වල තීරණ ගැනීම
- නම්‍යශීලීභාවය
- නුසුදුසු මුදල් ප්‍රවාහ විශ්ලේෂණය
- නුසුදුසු පුද්ගලික පුරුදු

***(මුළු ලකුණු 40 යි)***

***A කොටසෙහි අවසානය***

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර:

**පරිච්ඡේදය 01: ව්‍යාපාර සංවිධාන සහ බැඳුණු සංකල්ප**

### (a)

(1.) ආර්ථික ක්‍රියාකාරකමක් වීම:
ව්‍යාපාරික සංවිධානයකට නිශ්චිත අරමුණක් හෝ අරමුණු සමූහයක් ඇත. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානවලට සීමිත සම්පත් ඇත. එබැවින්, ඕනෑම ව්‍යාපාරික සංවිධානයක ආර්ථික ක්‍රියාකාරකම් සිදු වේ. ඒ අනුව, DK Juice Bar සතුව ආර්ථික ක්‍රියාකාරකමක් ඇත.

(2) මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරුව:
ව්‍යාපාරයක මූලික අරමුණ වන්නේ මිලදී ගැනීම සහ විකිණීම (වෙළඳාම) කිරීමයි. DK Juice Bar පළතුරු යුෂ අලෙවි කරන අතර පළතුරු යුෂ නිෂ්පාදනය සඳහා ද්‍රව්‍ය මිලදී ගනු ලැබේ.

(3) අඛණ්ඩ ක්‍රියාවලියක්:
ව්‍යාපාරයක් යනු එක් වරක් පමණක් ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් නොවේ. එය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා බෙදා හැරීමේ අඛණ්ඩ ක්‍රියාවලියකි. එය ව්‍යාපාර ගණනාවක අඛණ්ඩව වර්ධනය වන සහ ලාභදායීතාවය වැඩි කරවන ක්‍රියාවලියකි.

(4) ලාභය / ලාභය මඟින් පෙළඹවීම:
ව්‍යාපාරයක සාර්ථකත්වය පෙන්නුම් කරන මූලික දර්ශකය ලාභදායීතාවයයි. ව්‍යාපාරයක මූලික ඉලක්කය වන්නේ භාණ්ඩ හා සේවා විකිණීමෙන් උපරිම ලාභ උපයා ගැනීමයි. DK Juice Bar හි අභිප්‍රාය ද ලාභ උපයා ගැනීමයි.

(5) අවදානම සහ අවිනිශ්චිතතාව:
අවදානම යනු ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට එරෙහිව පවතින අවිනිශ්චිතතාවයයි. එනම්, අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර නොගැනීමේ සම්භාවිතාවයි. මෙය ව්‍යාපාරයේ ස්වභාවයයි. එවැනි අවිනිශ්චිතතා මෙන්ම අවදානම් ද ව්‍යාපාරික පරිසරය තුළ පවතින විවිධ බලවේග සහ කොන්දේසි කෙරෙහි බලපායි.

(6) අවශ්‍යතා හෝ නිර්මාණශීලීත්වය නිර්මාණය කිරීම:
මෙයින් අදහස් කරන්නේ වෙනස් වන ව්‍යාපාරික පරිසරයන්ට අනුවර්තනය වීමට නවෝත්පාදන ඒකකයක් වීමයි. ව්‍යාපාර මිනිස් අවශ්‍යතා සඳහා නිෂ්පාදන නිර්මාණය කරන ඒකක ලෙස හඳුනාගත හැකිය. තම ගනුදෙනුකරුවන්ට අවශ්‍ය නිෂ්පාදන මොනවාද, ඒවා නිෂ්පාදනය කරන්නේ කෙසේද සහ එය අවශ්‍ය විටදී තීරණය කිරීම ව්‍යාපාරයේ ලක්ෂණයකි.

එම නිසා, DK Juice Bar ව්‍යාපාරයක් ලෙස පැහැදිලිව හඳුනාගත හැකිය.

***(ලකුණු 03 යි)***

aat SRI LANKA

**(b)** කේවලස්වාමි ව්‍යාපාරයක් සහ හවුල් ව්‍යාපාරයක් පහත පරිදි වෙන්කර හඳුනාගත හැකියඃ

| පදනම | කේවලස්වාමි ව්‍යාපාරය | හවුල් ව්‍යාපාරය |
|---|---|---|
| හිමිකාරිත්වය | ■ තනි පුද්ගලයෙකුට (හිමිකරු) අයත් වේ | ■ හවුල්කරුවන් සංඛ්‍යාව 2ත් 20ත් අතර වේ. |
| ලාභ සහ අලාභ | ■ ලාභ සහ අලාභ හිමිකරු විසින් තනිවම භුක්ති විඳියි. | ■ එකඟ වූ පරිදි හවුල්කරුවන් අතර ලාභ හා අලාභ බෙදා ගනු ලැබේ. |
| කළමනාකරණය | ■ කළමනාකරණය සහ පාලනය හිමිකරු විසින් සිදු කරනු ලැබේ | ■ කළමනාකරණය සියලුම හවුල්කරුවන් හෝ කිහිප දෙනෙකු විසින් සිදු කරනු ලැබේ. |

*(ලකුණු 03 යි)*

**(c) හවුල් ව්‍යාපාරයකට සාපේක්ෂව සීමිත පුද්ගලික සමාගමක ඇති වාසිඃ**

- ■ සීමිත වගකීම්
- ■ නීතිමය පුද්ගලභාවය
- ■ අඛණ්ඩ පැවැත්ම
- ■ පවුල තුළ ඥාතීන්ගේ අයිතිවාසිකම් පවත්වා ගැනීමේ හැකියාව.
- ■ සීමිත පිරිසක් අතර සමාගමේ පාලනය රඳවා ගැනීමේ හැකියාව.
- ■ සීමිත පිරිසක් අතර ලාභ බෙදා ගැනීමේ හැකියාව.
- ■ වැඩි ප්‍රාග්ධනයක් රැස් කිරීමේ හැකියාව.
- ■ කළමනාකරණ මණ්ඩලය මගින් සිදුවන ඵලදායී කළමනාකරණය.
- ■ සියලුම කොටස් හිමියන්ගේ ඒකමතික යෝජනාවක් නොපවත්වා සමාගමේ බොහෝ කාර්යයන් ඉටු කිරීමේ හැකියාව.
- ■ ණය පරීක්ෂණයකින් තොරව කොටස් හිමියන්ට ලාභාංශ බෙදා හැරීමේ හැකියාව.
- ■ විවිධ බදු දිරිගැන්වීම්.
- ■ ප්‍රාග්ධනය රැස් කිරීම සාපේක්ෂව පහසු වීම

*(ලකුණු 04 යි)*

*(මුළු ලකුණු 10 යි)*

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 03ඃ ව්‍යාපාරවලට අදාළ උපකාරක සේවා**

**(a)** අනුෂ්කාට සලකා බැලිය හැකි විවිධ රක්ෂණ ඔප්පු වර්ග තිබේ. රක්ෂණයේ අරමුණ සහ අවශ්‍යතාවය ව්‍යාපාරික ප්‍රමුඛතා මත පදනම්ව වෙනස් විය හැකිය. එවැනි රක්ෂණවලට පහත සඳහන් දෑ ඇතුළත් විය හැකියඃ

i ගිනි රක්ෂණය
ii මුහුදු උවදුරු රක්ෂණය
iii සොරකම් රක්ෂණය
iv යන්ත්‍රෝපකරණ බිඳවැටීම් රක්ෂණය
v සේවායෝජකයාගේ වගකීම / සේවක වන්දි රක්ෂණය
vi මහජන වගකීම් රක්ෂණය
vii ණය රක්ෂණය
viii මෝටර් රථ රක්ෂණය
ix ජීවිත රක්ෂණය
x ස්වාභාවික විපත් රක්ෂණය

SRI LANKA

xi ප්‍රවාහන භාණ්ඩ රක්ෂණය

xii ප්‍රවාහන මුදල් රක්ෂණය

***(ලකුණු 02 යි)***

**(b)** පහත පරිදි රක්ෂණයට අදාළ වන විවිධ මූලධර්ම කිහිපයකි,

i උපරිම විශ්වාසය

ii රක්ෂණ හිමිකම

iii හානි පූරණය

(අ) ආදේශනය

(ආ) දායකත්වය

iv ආසන්නම හේතුව

***(ලකුණු 02 යි)***

**(c)** අනුෂ්කාගේ ව්‍යාපාරයට මෙන්ම ආර්ථික සංවර්ධනයට රක්ෂණය වැදගත් වේ. මෙම වැදගත්කමට හේතු පහත පරිදි පැහැදිලි කළ හැකිය:

■ **ව්‍යාපාර අලාභයේ අවිනිශ්චිතතාවය අඩු වේ:** රක්ෂණය අනපේක්ෂිත පාඩුවලට එරෙහිව මූල්‍ය ආරක්ෂාව සපයයි, ව්‍යාපාර අවදානම සහ අවිනිශ්චිතතාවය අඩු කරයි.

■ **ව්‍යාපාර අඛණ්ඩ පැවැත්ම :** රක්ෂණය මඟින් හානි අවම කිරීම නිසා අනතුරු හෝ ව්‍යසනයන්ගෙන් පසුව පවා ව්‍යාපාරයේ අඛණ්ඩ මෙහෙයුම් සහතික කෙරේ.

■ **ආයෝජන සඳහා සහාය වේ:** රක්ෂණ මගින් යන්ත්‍රෝපකරණ නිශ්පාදනය සහ අපනයන සඳහා මහා පරිමාණ ආයෝජන දිරිමත් කරනු ලබන්නේ ඇතැම් පාඩු වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සහතිකයක් ලබා දීමෙනි.

■ **ණය ලබා ගැනීමේදී ~~විශ්වාසය සහ~~ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම:** බැංකු ණය ලබා ගැනීමේදී රක්ෂණය ණය සුදුසුකම් වැඩි දියුණු කරයි, මන්ද ඒවා ඇතැම් අවස්ථාවලදී ඇපකර ප්‍රභවයක් ලෙස භාවිත කළ හැකිය.

■ **සේවකයින්ට සහ කළමනාකරණයට සහතික වීම:** රක්ෂණය මඟින් සේවකයින් සහ කළමනාකරණය ඇතැම් දුෂ්කර තත්ත්වයන් යටතේ මූල්‍ය දුෂ්කරතාවයන්ගෙන් ආරක්ෂා කරයි.

■ **වර්ධනය ශක්තිමත් කිරීම:** රක්ෂණය ආයෝජන සහ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරයි, ආර්ථික වර්ධනයට සහාය වන අතර කාර්මික වර්ධනයට සහ ආර්ථික ව්‍යාප්තියට සහාය වේ.

■ **පුළුල් වෙළඳපල ප්‍රවේශයක් සඳහා පහසුකම් සැලසීම:** රක්ෂණය මඟින් ඇතැම් පාඩු සඳහා ආවරණ සැපයීම හරහා ජාත්‍යන්තර වෙළඳාම සහ අපනයන සඳහා පහසුකම් සපයයි.

■ **රැකියා වර්ධනය:** රක්ෂණය ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ජනනය කරයි.

■ **මූල්‍ය දායකත්වය:** රක්ෂණය ජාතික සංවර්ධනය සඳහා දිගුකාලීන ඉතිරිකිරීම් එක්රැස් කරන අතර මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට සහාය වේ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම වැනි විවිධ ආයෝජනවල නියැලී සිටින රක්ෂණ සමාගම් ආර්ථික සංවර්ධනයට උපකාරී වේ.

■ **ව්‍යාපාර කාර්යක්ෂමතාව වැඩි කිරීම:** අලාභයේ අවිනිශ්චිතතාවය ව්‍යාපාරිකයන්ගේ මනසට අහිතකර ලෙස බලපෑ හැකිය. අවිනිශ්චිතතාවය ඉවත් කරමින් රක්ෂණය ව්‍යාපාරිකයන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට උත්තේජනය කරයි.

SRI LANKA

■ **සේවක සුභසාධනයඃ** සේවකයින්ගේ සුභසාධනය සේවායෝජකයාගේ වගකීමකි. සේවකයින්ට රක්ෂණ පහසුකමක් ලබා දීමෙන් ඔවුන්ගේ සුභසාධන පහසුකම් වැඩි දියුණු වේ. එය වැඩ කිරීමට සේවකයන් අභිප්‍රේරණය කරයි.

***(ලකුණු 06 යි)***

***(මුළු ලකුණු 10 යි)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

**පරිච්ඡේදය 04ඃ ව්‍යාපාර සංවිධානවල වෙළෙඳාම**
**පරිච්ඡේදය 03ඃ ව්‍යාපාරවලට අදාළ උපකාරක සේවා**

**(a)** ඵලදායී සැපයුම් පද්ධතියක් සඳහා සලකා බැලිය යුතු සාධක

- ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමේ හැකියාව
- ප්‍රවාහන පිරිවැය
- දුර සහ ස්ථානය
- කාලය කළමනාකරණය
- ගබඩා පහසුකම්
- ඇසුරුම් කිරීම
- තොග කළමනාකරණය
- යටිතල පහසුකම්
- ලේඛනගත කිරීම සහ අනුකූලතාවය
- අවදානම් කළමනාකරණය සහ රක්ෂණය
- තොරතුරු තාක්ෂණය

***(ලකුණු 03 යි)***

**(b)** බෙදාහැරීමේ මාර්ග නිසි ලෙස කළමනාකරණය නොකළහොත් තරිඳුට යම් යම් අවාසි ඇති විය හැකිය. ඒවායින් සමහරක් පහත දැක්වේ,

■ **අකාර්යක්ෂමතාව හේතුවෙන් බෙදාහැරීමේ පිරිවැය වැඩිවීම**, එහි ප්‍රතිඵලයක් ලෙස ලාභදායිතාවයට සෘණාත්මක බලපෑමක් ඇති කරයි.

■ **වෙළඳපල කොටසට සිදුවන හානියඃ** බෙදා හැරීමේ ප්‍රමාදයන්, පාරිභෝගික අතෘප්තියට හේතු වන අතර එමගින් වෙළඳපල කොටස අහිමි වීමේ අවදානමක් ඇති වේ.

■ **භාණ්ඩවලට හානි වීම**, අඩු ගුණාත්මක ගබඩා හෝ බෙදාහැරීමේ පහසුකම් හේතුවෙන් විශේෂයෙන් කුළුබඩු වල ගුණාත්මක බව අඩු වීම , පාරිභෝගික සෘනාත්මක ප්‍රතිපෝෂණවලට හේතු වීම.

■ **විදේශීය ගැනුම්කරුවන් අහිමි වීම සහ වෙළඳපල කීර්තිය අඩු වීම**, වෙළඳ නාමයට අහිතකර ලෙස බලපෑ හැකිය.

■ **අතරමැදියන් සමඟ දුර්වල සම්බන්ධීකරණය**, සැපයුම් දාමයේ පිරිවැය වැඩි කිරීම, අවසානයේ වෙළඳපොළ දාමයන්ට සහ ලාභදායිතාවයට අහිතකර ලෙස බලපායි.
**තොග තබා ගැනීමේ පිරිවැය ඉහළ යාම,** තොගයට වන හානි සහ ප්‍රමාදයන් හේතුවෙන් ලාභදායිතාවය අහිමි වීම

■ **ජාත්‍යන්තර වෙළෙඳපොළවල තරඟකාරිත්වය අඩුවීම,** සෘණාත්මක පාරිභෝගික අත්දැකීම් හේතුවෙන් දිගුකාලීන වෙළෙඳපොළ ස්ථාවරත්වයට බලපායි.

■ **ලාභ අඩු වීම**, නාස්තිය සහ අකාර්යක්ෂමතාව හේතුවෙන් ලාභ අඩු වීම සහ සැපයුම් පිරිවැය වැඩිවීම හේතුවෙන් ව්‍යාපාරයේ පැවැත්මට තර්ජනයක් වීම.

■ නීතිමය වියදම් වැඩි වීමඃ බෙදාහැරීමේ දාමයට සහභාගී වන පාර්ශ්වයන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙන්ම ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා වන්දි සහ අනෙකුත් නීතිමය වියදම් සඳහා ව්‍යාපාරයට අමතර පිරිවැයක් දැරීමට සිදුවිය හැකිය.

***(ලකුණු 05 යි)***



aat SRI LANKA

**(c)** ඒකපාර්ශ්වික වෙළඳ ගිවිසුමක් යනු එක් රටක් අන්‍යෝන්‍ය ප්‍රතිලාභ අපේක්ෂා නොකර තවත් රටකට වෙළඳ ප්‍රතිලාභ (තීරුබදු අඩු කිරීම් හෝ වෙළඳපල ප්‍රවේශය වැනි) ලබා දෙන වෙළඳ විධානයකි. උදාහරණයඃ සංවර්ධිත රටක්, සංවර්ධනය වෙමින් පවතින රටකින් ආනයන සඳහා තීරුබදු රහිත ප්‍රවේශයට ඉඩ සැලසීම

හෝ

ජාතියක් අන් අය ගැන නොසලකා පනවන වාණිජ ගිවිසුමකි. එයින් ප්‍රතිලාභ ලැබෙන්නේ එම එක් රටකට පමණි. එය ඒකපාර්ශ්වික වන්නේ අනෙක් ජාතීන්ට මේ කාරණය සම්බන්ධයෙන් වෙනත් විකල්පයක් නොමැති බැවිනි. එය සාකච්ඡා සඳහා විවෘත නොවේ.

*(ලකුණු 02 යි)*

*(මුළු ලකුණු 10 යි)*

## පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| |
|---|
| **පරිච්ඡේදය 6ඃ-කුඩා හා මධ්‍යපරිමාණ ව්‍යාපාර**<br>**පරිච්ඡේදය 5ඃ ව්‍යාපාර කෙරෙහි රජයේ බලපෑම, ව්‍යාපාරයකට ව්‍යාපාර ආචාරධර්ම හා සමාජයීය වගකීම්වල ඇති වැදගත්කම** |

**(a)** ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයක් ලෙස ලංකා ක්‍රාෆ්ට්ස් හි කාර්ය සාධනය වැඩි දියුණු කිරීමේ ක්‍රම

- ව්‍යවසායකත්ව සංස්කෘතිය සහ කුසලතා සංවර්ධනය
- මූල්‍ය සඳහා ප්‍රවේශය
- වෙළඳපොළ පහසුකම් සැපයීම
- කලාපීය සමතුලිතතාවය
- ආනයනික භාණ්ඩ සමඟ තරඟ කිරීමට නිෂ්පාදන ගුණාත්මකභාවය සහ නිර්මාණය වැඩිදියුණු කිරීම
- නිෂ්පාදනයේ නවීන තාක්ෂණය සහ මෙවලම් භාවිතා කිරීම
- සේවකයින් සඳහා පුහුණුව සහ කුසලතා සංවර්ධනය ලබා දීම
- ඵලදායී පිරිවැය පාලනය සහ මූල්‍ය කළමනාකරණය
- ශක්තිමත් වෙළඳ නාමකරණය සහ අලෙවිකරණ උපායමාර්ග සංවර්ධනය කිරීම
- මාර්ගගත සහ අපනයන වෙළඳපොළ පුළුල් කිරීම
- රජයේ දිරිගැන්වීම් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහාය යෝජනා ක්‍රම වෙත ප්‍රවේශ වීම
- ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- සැපයුම්කරු සබඳතා ශක්තිමත් කිරීම
- නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය / පර්යේෂණ සහ සංවර්ධනය දිරිමත් කිරීම
- පරිසරය සක්‍රීය කිරීම

*(ලකුණු 03 යි)*

**(b)** රජය ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන ආකාර

(1) ගනුදෙනුකරුවෙකු ලෙස ව්‍යාපාරවලට රජයේ බලපෑම.

(2) තරඟකරුවෙකු ලෙස ව්‍යාපාරවලට රජයේ බලපෑම.

(3) යටිතල පහසුකම් සහ අත්‍යවශ්‍ය සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාරවලට බලපෑම.

(4) නියාමනකරුවෙකු ලෙස රජයේ බලපෑම.

(5) දිරිගැන්වීමේ සැපයුම්කරුවෙකු ලෙස ව්‍යාපාරවලට රජයේ බලපෑම.

(6) මූල්‍ය ආධාර / පහසුකම් ලබා දීමෙන්, රජය ව්‍යාපාර සංවර්ධනයට සහාය වේ.

පහත සඳහන් කරුණු සඳහා ද ලකුණු ලබා දිය යුතුය
- බදු ප්‍රතිපත්ති (බදු සහන, වැට් බදු, ආදායම් බදු)
- වෙළඳ ප්‍රතිපත්ති (ආනයන තීරුබදු, අපනයන දිරිගැන්වීම්)
- කම්කරු නීති සහ රෙගුලාසි
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා පුහුණු සහ සංවර්ධන වැඩසටහන්
- මූල්‍ය ආධාර යෝජනා ක්‍රම (ණය, ප්‍රදාන, සහනාධාර)
- බලපත්‍ර සහ ලියාපදිංචි අවශ්‍යතා
- පාරිසරික රෙගුලාසි
- යටිතල පහසුකම් සංවර්ධනය (මාර්ග, වරාය, උපයෝගිතා)
- මුදල් හා මූල්‍ය ප්‍රතිපත්ති
- මිල පාලනය සහ ප්‍රමිතීන්

*(ලකුණු 03 යි)*

## (c)

**(1) සමාජය කෙරෙහි වගකීම:**

සමාජය කෙරෙහි ව්‍යාපාරික සමාජ වගකීමක් යනු සදාචාරාත්මකව ක්‍රියා කිරීම සහ ලාභයෙන් ඔබ්බට පොදු යහපැවැත්මට දායක වීම, පරිසර ආරක්ෂාව, සදාචාරාත්මක මෙහෙයුම් ආදිය කෙරෙහි අවධානය යොමු කිරීමට ඇති බැඳීමයි.

**(2) පාරිභෝගිකයා කෙරෙහි වගකීම:**

ව්‍යාපාරිකයෙකු විශ්වාසවන්ත, වංචාවෙන් තොරව සාධාරණ විය යුතුය. එසේ කිරීමට ව්‍යාපාරිකයින් පහත සඳහන් පියවර අනුගමනය කළ යුතුය:
- භාණ්ඩ හා සේවා පිළිබඳ නිවැරදි තොරතුරු සැපයීම
- වෙනස් කිරීමකින් තොරව භාණ්ඩ හා සේවා සැපයීම
- පොරොන්දු වූ පරිදි මිල සහ අනෙකුත් ක්‍රියාකාරකම්
- පාරිභෝගිකයින්ට ගුණාත්මක නිෂ්පාදන සැපයීම

**(3) සේවකයින් කෙරෙහි සමාජ වගකීම**

ව්‍යාපාර සේවකයින්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය සහ සමානාත්මතාවය සහතික කළ යුතුය. සේවකයින් සඳහා සමාජ වගකීම ඉටු කළ හැක්කේ:
- සේවායෝජක-සේවක සබඳතා වැඩිදියුණු කිරීමට පියවර ගැනීම.
- ධනාත්මක ආකාරයකින් ව්‍යාපාර කටයුතු සිදු කිරීම.
- සේවකයින්ගේ පුද්ගලික ඉලක්ක කෙරෙහි අවධානය යොමු කිරීම.
- වැඩ කිරීමේ සමානාත්මතාවය ආරක්ෂා කිරීම.
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්පන්න පරිසරයක් සහතික කිරීම සඳහා ආරක්ෂක වැඩසටහනක් අනුගමනය කිරීම.
- කාර්මික අනතුරු සහ වෘත්තීය රෝග සඳහා වන්දි ගෙවීම.
- අවදානම් ආවරණය සඳහා රක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ~~ආදිය මගින්~~

**(4) ආයෝජකයින් කෙරෙහි සමාජ වගකීම**

අයිතිකරුවන්, කොටස් හිමියන් සහ අනෙකුත් අරමුදල් සපයන්නන්ගේ මුදල් සඳහා සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීම කළමනාකරුවන්ගේ වගකීම වේ. සම්පත් අනිසි ලෙස භාවිත නොකිරීමට සහ කාර්යක්ෂම හා විනිවිදභාවයෙන් යුතුව කළමනාකරණය කිරීමට කළමනාකරුවන් සහතික විය යුතුය.

*(ලකුණු 04 යි)*

*(මුළු ලකුණු 10 යි)*

***B කොටසෙහි අවසානය***

aat SRI LANKA

(මුළු ලකුණු 20 යි)

**C කොටස**

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| | |
|---|---|
| **පරිච්ඡේදය** | **2ඃ ව්‍යාපාර පරිසරය සහ ව්‍යාපාර සංවිධාන කෙරෙහි එහි බලපෑම** |
| **පරිච්ඡේදය** | **3ඃ ව්‍යාපාරවලට අදාල උපකාරක සේවා** |
| **පරිච්ඡේදය** | **7ඃ ව්‍යවසායකත්වයේ දායකත්වය** |

**(a)** ජයලත් අපනයන (පුද්ගලික) සමාගමේ ශදුඅත (SWOT) විශ්ලේෂණය.

**ශක්තීන්**

- (1998) සිට කුළුබඩු කර්මාන්තයේ දිගු ව්‍යාපාරික පළපුරුද්ද (වසර (27) කට වැඩි)
- හොඳ කීර්තියක් ඇතිව යුරෝපයට සහ ආසියාවට අගය එකතු කළ සහ සැකසූ කුළුබඩු අපනයනය කිරීම
- මූල්‍යකරණයට ප්‍රවේශ වීමට ඉඩ සලසන සීමිත වගකීම් සහිත පුද්ගලික සීමිත සමාගමක් වීම
- ජාත්‍යන්තර වෙළඳපල ගවේෂණය කිරීම
- නවීන ඇසුරුම්කරණය සහ ජාත්‍යන්තර සහතික සඳහා ආයෝජනය කර තිබීම
- කුඩා වතු හිමියන් සමඟ ශක්තිමත් සබඳතා පවත්වාගෙන යාම
- ඩිජිටල් වේදිකා සහ විද්‍යුත්-වාණිජ්‍යය භාවිතය
- නීතිමය ශක්තිය සහ විශ්වසනීයත්වය
- ස්ථාපිත සැකසුම් මධ්‍යස්ථාන දෙකක් තිබීම

**දුර්වලතා**

- අමුද්‍රව්‍ය අඛණ්ඩව ලබා ගැනීමේ දුෂ්කරතා ඇතිවීම
- නිෂ්පාදන පිරිවැය, සැපයුම් සහ නැව්ගත කිරීමේ පිරිවැය ඉහළ යාම
- බාහිර ප්‍රවාහනය, වරාය කාර්යක්ෂමතාව, නාවික වෙළඳ සමාගම් , සීමිත සැපයුම් පාලනයන් මත යැපීම

**අවස්ථා**

- කාබනික සහ තිරසාර ශ්‍රී ලාංකික කුළුබඩු සඳහා ගෝලීය ඉල්ලුම වැඩිවීම
- විද්‍යුත් වාණිජ්‍ය වේදිකා වල වර්ධනය
- ගෝලීයකරණය සහ ඩිජිටල් වෙළඳාම මත නව අවස්ථා විවෘත වීම

**තර්ජන**

- ඉන්දියාව, වියට්නාමය සහ අනෙකුත් කුළුබඩු අපනයනකරුවන්ගෙන් දැඩි තරඟකාරිත්වයක් ඇති වීම
- ආර්ථික අර්බුදය හේතුවෙන් ඉහළ උද්ධමනය
- වසංගත සහ දේශපාලනික ගැටළු වැනි ගෝලීය බාධා
- දේශගුණික විපර්යාස සහ අක්‍රමවත් කාලගුණික රටා
- ශ්‍රී ලංකාවේ දේශපාලන අස්ථාවරත්වය සමඟ නිතර ප්‍රතිපත්ති වෙනස්කම්
- විනිමය අනුපාත අස්ථාවරත්වය / විදේශ මුදල් හිඟය
- සැපයුම් දාම බාධා

***(ලකුණු 06 යි)***

SRI LANKA

**(b)** ගෝලීය ව්‍යාපාරික පරිසරය ජයලත් එක්ස්පෝර්ට්ස් (පුද්ගලික) සමාගමට බලපාන ආකාරය.

■ **ගෝලීය ආර්ථික තත්ත්වයන්** - උද්ධමනය, අවපාත හෝ ගෝලීය වෙළෙඳපොළවල වර්ධනය කුළුබඩු අපනයනවල ඉල්ලුම, මිල ගණන් සහ ලාභදායිතාවයට බලපායි.

■ **ජාත්‍යන්තර වෙළඳ බාධා** - වසංගත හෝ දේශපාලනික ගැටුම් වැනි සිදුවීම් නැව්ගත කිරීමේ ප්‍රමාදයන් සහ ඉහළ සැපයුම් පිරිවැය ඇති කරයි.

■ **විදේශ විනිමය අනුපාතික උච්චාවචනයන්** - විනිමය අනුපාතිකවල වෙනස්වීම් අපනයන ඉපැයීම් සහ ආනයනික යෙදවුම්වල පිරිවැයට බලපායි.

■ **ගෝලීය තරඟකාරිත්වය** - ඉන්දියාව සහ වියට්නාමය වැනි රටවලින් එල්ල වන දැඩි එදිරිවාදිකම් මිලකරණයට සහ වෙළඳපල කොටසට බලපෑම් කරයි.

■ **ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ රෙගුලාසි** - තත්ත්ව සහතික සහ ආහාර සුරක්ෂිතතා ප්‍රමිතීන් සඳහා වන අවශ්‍යතාවය අනුකූලතා පිරිවැය වැඩි කරයි.

■ **ගෝලීය ඉල්ලුම් ප්‍රවණතා** - කාබනික සහ තිරසාර නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම වැඩිවීම නව අවස්ථා නිර්මාණය කරයි.

■ **ගෝලීය ඩිජිටල්කරණය සහ විද්‍යුත් වාණිජ්‍යය:** ජයලත් අපනයන (පුද්ගලික) සමාගමට ගනුදෙනුකරුවන් වෙත සෘජුවම ළඟා විය හැකි අතර, අතරමැදියන් මත යැපීම අඩු කළ හැකි නමුත්, තොරතුරු තාක්ෂණ, සයිබර් ආරක්ෂාව සහ ඩිජිටල් කුසලතා සඳහා ආයෝජනය කළ යුතුය.

■ තිරසාරභාවය සහ ESG ඉල්ලීම්: කාබනික සහ පරිසර හිතකාමී නිෂ්පාදන සඳහා වර්ධනය වන වෙළඳපොළ; ජයලත් අපනයන (පුද්ගලික) සමාගම සහතික කිරීම් සහ පරිසර හිතකාමී පිළිවෙත් පවත්වා ගත යුතු අතර, පිරිවැය වැඩි කරන නමුත් ඉහල වටිනකමකින් යුතු ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කරයි.

■ භූ දේශපාලනික සහ වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම්: තීරුබදු බාධක, සම්බාධක හෝ ආනයන තහනම් කිරීම් (උදා: අර්බුදකාරී කාලවලදී ශ්‍රී ලංකාවේ ආනයන සීමා කිරීම්) අපනයනවලට බාධා සිදු කළ හැකිය; වෙළඳපොළ විවිධාංගීකරණය අවශ්‍ය වේ.

■ දේශගුණික විපර්යාස සහ ස්වාභාවික පාරිසරික අභියෝග: බෝග අස්වැන්න උච්චාවචනය, සැපයුම් පදනම විවිධාංගීකරණය කිරීම, ගොවීන් පුහුණු කිරීම සඳහා ආයෝජනය කිරීම සහ දේශගුණයට ඔරොත්තු දෙන භෝග පිළිබඳ ගවේෂණය කිරීමට සිදු වීම.

***(ලකුණු 04 යි)***

**(c)** ජයලත් අපනයන (පුද්ගලික) සමාගම සඳහා අවශ්‍ය ප්‍රවාහන පද්ධතියක අංග

- මාර්ගය
- මාධ්‍යය
- බලය
- පර්යන්තය

***(ලකුණු 03 යි)***

**(d)** ජයලත් අපනයන (පුද්ගලික) සමාගම සඳහා ඵලදායී ප්‍රවාහන පද්ධතියක වාසි.

- ජාත්‍යන්තර ගැනුම්කරුවන්ට භාණ්ඩ කාලෝචිත ලෙස බෙදා හැරීම සහතික කරයි
- ප්‍රවාහන සහ හැසිරවීමේ පිරිවැය අඩු කරයි
- අපනයනය කරන ලද කුළුබඩු වල ගුණාත්මකභාවය පවත්වා ගනී
- පාරිභෝගික තෘප්තිය සහ කීර්තිය වැඩි දියුණු කරයි

- අපනයන තරඟකාරිත්වය වැඩි දියුණු කරයි
- අවශ්‍ය භෞතික හා මානව සම්පත් කාලෝචිත ලෙස ප්‍රසම්පාදනය කිරීම.
- පාරිභෝගිකයාට නිෂ්පාදන අඛණ්ඩව බෙදා හැරීම.
- නියමිත වේලාවට නිවැරදි වෙළඳපොළට යාම.
- ප්‍රවාහනය මඟින් පාරිභෝගිකයින්ට ඕනෑම තැනක සිට භාණ්ඩ මිලදී ගැනීමට හැකියාව ලැබීම.

***(ලකුණු 03 යි)***

**(e)** ව්‍යවසායකත්වයේ සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ

- නව රැකියා අවස්ථා නිර්මාණය කිරීම
- ජාතික ආදායම සහ අපනයන ඉපැයීම් වැඩි කිරීම
- නවෝත්පාදනය සහ අගය එකතු කිරීම දිරිමත් කරයි
- ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය ප්‍රවර්ධනය කරයි
- ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කරයි
- ආර්ථික වර්ධනයට මඟ පාදයි
- නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දරිද්‍රතාවය අඩු කිරීම
- සාධාරණ තරඟකාරිත්වයක් ඇති කිරීම
- තිරසාර ආර්ථික සංවර්ධනයකට මඟ පාදයි
- නව ආදායම් සහ සේවා සඳහා පරිභෝජනය සඳහා අවස්ථා ලබා දීම.
- නිෂ්පාදනය සඳහා දේශීය සම්පත් භාවිත කිරීම
- නව වෙළඳපොළවල් සංවර්ධනය කිරීම.

***(ලකුණු 04 යි)***

***(මුළු ලකුණු 20 යි)***

***C කොටසෙහි අවසානය***

aat SRI LANKA

## *Notice:*

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to questions set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, design especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well and stay relevant in the art of answering questions at examination level.

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*